# මහජනතාව වෙත කෙරෙන නිවේදනය යි!

ශ්‍රී ලංකා මහ බැංකුව

இலங்கை மத்திய வங்கி

CENTRAL BANK OF SRI LANKA

## පිරමීඩ යෝජනා ක්‍රමවලට සහභාගී වීම දඬුවම් ලැබිය හැකි වරදකි!

පහත දක්වා ඇති ආයතන තහනම් යෝජනා ක්‍රම පවත්වා ගෙන යන බව/ පවත්වා ගෙන ගොස් ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කර ඇත.

1. **Tiens Lanka Health Care (Pvt) Ltd.**
2. **Best Life International (Pvt) Ltd.**
3. **Global Lifestyle Lanka (Pvt) Ltd.**
4. **Mark-Wo International (Pvt) Ltd.**
5. **V M L International (Pvt) Ltd.**
6. **Fast 3Cycle International (Pvt) Ltd (F3C)**
7. **Sport Chain App, Sports Chain ZS Society Sri Lanka**
8. **OnmaxDT**

තහනම් කරන ලද ආකාරයේ පිරමීඩ යෝජනා ක්‍රමයක් ඍජුව හෝ වක්‍රව ආරම්භ කිරීම, පිරිනැමීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචාරණය කිරීම, පැවැත්වීම, මූල්‍යනය, කළමනාකරණය හෝ මෙහෙයවීම සිදු කරන ඕනෑම පුද්ගලයෙකු සිදු කරන්නේ දඬුවම් ලැබිය හැකි වරදකි.

**දැනට පිරමීඩ යෝජනා ක්‍රම පවත්වාගෙන යන ලෙස/පැවැත්වූ ලෙස තීරණය කර ඇති ඉහත ආයතන සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව යම් යම් එකඟතාවන්ට එළැඹී ඇති බවට සමාජයේ ඇතැම් කොටස් විසින් සිදු කරනු ලබන ප්‍රකාශයන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙසේ නම් කරන ලද පිරමීඩාකාර ව්‍යාපාර සඳහා, බැංකු පනතේ 83(ඇ) වගන්තිය යටතේ අපරාධමය නඩු කටයුතු පැවරීමට සලකා බලනු පිණිස ගරු නීතිපතිවරයා වෙත ඉල්ලීම් යොමු කර ඇත.**


ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

(Hotline) 1935 / +94 11 247 7966